**හානි පූර්ණය සඳහා වන කාර්යාලය - 2020**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1. මතය**

**--------**

හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැතේම් පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 අංක 4(2) | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා ඊලග එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සඳහා විස්තරාත්මකව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල යුතු වුවද රු.10,500,000 ක් වටිනා ප්‍රසම්පාදනයන් ඇතුළත් කර 2020 වර්ෂයට අදාළව පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොමැත. එසේ වුවද 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සවිස්තරාත්මක ව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |

### 1.6. මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානි පූර්ණය සඳහා වන කාර්යාලය විසින් බැංකුවට ලබා දී තිබුණු ස්ථාවර නියෝගයක් මත ජංගම ගිණුමේ අතිරික්ත මුදල් ස්වයංක්‍රියව ඉතිරිකිරීමේ ගිණුමක් හරහා හුවමාරු කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2013 වර්ෂයේ ජුනි මාසයේ සිට ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කර තිබුණු අතර මුදල් රෙගුලාසි 215 පටහැනිව ඉදිරි කටයුතු සඳහා අග්‍රිම මුදල් රඳවා ගැනීම සිදුකර තිබුණි. | ඉතිරි කිරිමේ ගිණුමෙන් ලැබෙන පොළිය කිසිදු නීති විරෝධී කටයුත්තක් වෙනුවෙන් වැය නොකරන අතර ඉතා විනිවිද භාවයෙන් කළමනාකරණය කර ඇති බව දැන්වීමට කැමැත්තෙමි. දැනට හානිපූරණය සඳහා වන කාර්යාලය අයත් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, මෙම ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යාම සඳහා එකගතාවයක් පළ නො කළ හෙයින් ආයතනය විසින් 2021 මාර්තු 01 වන දින ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ පවත්වා ගෙන යන ලද ගිණුම් අංක. | රජයේ මුදල් රෙගුලාසි 156(7) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ සියලුම මූල්‍ය ගණුදෙනුවලදී පිරිමැසුම්භාවයෙන් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එසේම, උක්ත ඉතිරිකිරීමේ ගිණුමට 2013 ජුනි මස සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.39,749,629 ක පොලී ආදායමක් රැස්කර ගෙන තිබුණි. හානි පූර්ණය සඳහා වන කාර්යාලයට මෙම අග්‍රිම පහසුකම ලබාදීම සඳහා භාණ්ඩාගාරයට කෙටිකාලීන ණය ගැනුම්පිරිවැය වශයෙන් ඊට වඩාවැඩි පිරිවැයක් දැරීමට සිදුවන බැවින් නිසි පරිදි අග්‍රිම කළමනාකරණය කර අවශ්‍ය අවස්ථාවේ දී භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබා ගන්නේනම් මහා භාණ්ඩාගාරට ලබාගෙන තිබුණු ප්‍රතිලාභය ඉක්මවූ මූල්‍ය පිරිවැයක් දැරීමට සිදු නොවන බව නිරීක්ෂණය විය. | 747557297 දරණ ඉතිරිකිරීමේ ගිණුම වසා දමා එහි මුළු ශේෂය ම හානිපූරණය සඳහා වන කාර්යාලයේ අංක 0002026495 දරණ ලංකා බැංකුවේ, තැප්‍රොබේන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට මාරු කර ඉතිරිකිරීමේ ගිණුම වසා දමන ලදී. මෙම පොලී මුදල් ආයතනයේ ඵලදායී වියදම් සඳහා උපයෝගී කර ගෙන ඇත. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,195,306 ක් අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.679,698 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,515,608 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වියදම රු.604,521,491 කින් අඩුවීම හා ආදායම රු.591,005,883 කින් අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.172,364,105 ක වන්දි ගෙවීමට ප්‍රතිලාභීන් 2,861 දෙනෙකුගේ ලිපිගොනු අනුමත කර තිබුණද ප්‍රතිපාදන නොමැති වීම නිසා 2021 මාර්තු 31 දින වන විටත් ප්‍රතිලාභීන් 2,757 ක් සඳහා වන්දි මුදල් රු.163,256,305 ක් ගෙවා නොතිබුණි. | මහා භාණ්ඩාගාරය වෙතින් වාර්ෂිකව ලබාදෙන ප්‍රතිපාදන පදනම් කරගෙන වන්දි මුදල් ගෙවනු ලබයි. 2020 දෙසැම්බර් 31 වන දින වනවිට අනුමත කරන ලද ලිපි ගොණු 2,861 න් 2021 මාර්තු 31 දිනට බලවත්සේ විපතට පත්වූවන් 83 ක් සඳහා රු.7,372,500 ක් ද, සාමාන්‍ය මහජන දේපළ වන්දිලාභීන් 21 ක් සඳහා රු.1,735,300 ක් හා පූජනීය ස්ථාන 08 ක් සඳහා රු. 2,050,000 ක් වන්දි මුදල් ගෙවා ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස් කර ප්‍රතිපාදන නියමිත පරිදි වෙන්කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද, වන්දි ලාභීන් හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව ලිපිගොනු නිර්දේශ කිරීම හා වන්දි ලබා දීම සිදු කිරීම හේතුවෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වී නොතිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ගතවී ඇති ප්‍රතිලාභීන් 34 කට අයත් රු.1,860,758 ක වන්දි සඳහා 2021 මාර්තු 31 දින වන විටද ප්‍රතිලාභීන් හිමිකම් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම හිමිකම් නොපෑ වන්දිලාභීන් වෙත නැවත ලිපි යොමු කර අදාළ යාවත්කාලීන කරන ලද තොරතුරු ලබාගැනීම සඳහා කටයුතු කර ඇතත් මෙම තොරතුරු ආයතනය වෙත ලැබීම පිළිබඳ මන්දගාමී බවක් පෙන්නුම් කරන බව පිළිගනිමි.<br><br>එබැවින්, ඉදිරියේදී, මෙම ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කර අදාළ ප්‍රතිලාභීන් වෙත වන්දි ලබාදීම සඳහා කටයුතු කරමි. | අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | පාස්කු ප්‍රහාරය හේතුවෙන් වන්දි ප්‍රදානය කිරීමේ දී එක් ප්‍රතිලාභියෙකුට ගෙවන ලද රු.300,000 ක අත්තිකාරම අඩු නොකර 2019 මැයි 15 දින ඉතිරි මුදල් ගෙවා තිබීම නිසා අනුමත වන්දි මුදල ඉක්මවා රු.300,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2021 මාර්තු 31 දින දක්වා කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. | ඔහුගේ බිරිඳ විසින් ආයතනය වෙත පැමිණ ඉදිරිපත් කළ ඉල්ලුම්පත සඳහා රු. 300,000 ක අත්තිකාරම් මුදල ගෙවීමට කටයුතු කළ අතර පසුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ද අදාල මහත්මිය විසින් වංචනික ලෙස වෙනත් අයදුම්පතක් ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙසේ වැඩිපුර මුදලක් ගෙවීම් කර ඇත. | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වැරදි හෝ වංචා නිසා රජයට සිදුවන පාඩු සම්බන්ධව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 128 (1) 'ජ'ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද්විතික මට්ටමේ පුරප්පාඩු 19 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද ඇතුලත්ව මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් පැවතුණි. මීට අමතරව අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂක තනතුරු 02 ක සඳහා ස්ථිර පදනමින් බඳවා නොගෙන වැඩබලන පත්වීම් සිදු කර තිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි සියළු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී.<br><br>අමාත්‍යාංශ ලේකම් සමඟ පැවැති සාකච්ඡාවේ දී තීරණය වූ කරුණුවලට අනුව පුරප්පාඩු පැවැති හානිපූරණ සහකාර තනතුරු සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කිරීම, දැනට අත්‍යවශ්‍ය තනතුරු සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කිරීමට තීරණය විය.<br><br>තවද පුප්පාඩුව පැවැති අභ්‍යන්තර විගණක තනතුර සඳහා නව බඳවා ගැනීම් සිදුකර ඇත. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. |